පරිශුද්ධ දේව මාතාවන් වන
මරියෝත්තමාවන්ගේ මංගලෝත්සවය

**දේව ප්‍රකාශන**

01-01-13

## පළමුවන කියැවීම

ගණන් කථාව 6:22-27

ගණන් කථාවෙන් ගත් පාඨයකි.

**ඔවුන් මාගේ නාමය කියා අයදින විට මම ද ඔවුන්ට ආසිරි වස්වමි.**

සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට මෙසේ වදාල සේක. "ආරොන් සහ ඔහුගේ පුත්‍රයන් අමතා, 'නුඹලා ඉශ්රායෙල් ජනයාට ආශිර්වාද කරන විට මෙලෙස කිව යුතු වේ. සමිඳාණෝ ඔබට ආශිර්වාද කොට ඔබේ ආරක්‍ෂා කරන සේක්වා! සමිඳාණෝ ඔබ දෙස දයාවෙන් බලා ඔබට කරුණා කරන සේක්වා! සමිඳාණෝ සිය නෙත් ඔබ කෙරෙහි යොමා ඔබට සමාදානය දෙන සේක්වා!' ඔවුන් ඉශ්රායෙල් ජනයා වෙනුවෙන් මාගේ නාමය කියා අයදිනවා ඇත. එවිට මම ද ඔවුන්ට ආසිරි වස්වමි."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 67:1-7

පිළිතුර: දෙවිඳාණෝ අප වෙත දයාව පාමින් කරුණා කරන සේක්වා!

ගීය: දෙවිඳාණෝ අප වෙත දයාව පාමින් කරුණාව පෙන්වන සේක්වා! එවිට මුළු ලොව ඔබේ කැමැත්ත දැන ගන්නේ ය. සියලු විජාතීහු ඔබේ ගැළවීමේ බලය දැනගන්නෝ ය.

අහෝ දෙවිඳුනි, ජනතාවෝ ඔබ පසසත්වා. සියළු ජාතීහු ඔබ පසසත්වා! ඔබ සාධාරණ ලෙස මිනිසුන් විනිශ්චය කරන සේක. මිහිපිට විජාතීන් හට ඔබ මග පෙන්වන සේක. එබැවින් සකල ජනයා ප්‍රීතිමත් ව සතුටින් ගී ගයත්වා!

අහෝ දෙවිඳුනි. ජනතාවෝ ඔබ පසසත්වා. සියලු ජාතීහු ඔබ පසසත්වා. පොළොව පලදාව බහුලව නිපදවිය. දෙවිඳාණෝ, අපේ දෙවිඳාණෝ, අපට ආසිරි දුන් සේක. අපේ දෙවිඳාණෝ අපට ආසිරි වස්වන සේක් වා!

## දෙවන කියැවීම

ගලාති 4:4-7

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් ගලාතිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**දෙවියන් වහන්සේ ස්ත්‍රීය ගෙන් උපත ලත් සිය පුත්‍රයාණන් එවා වදාළ සේක.**

එහෙත් කාලය සම්පූර්ණ වූ කල දෙවියන් වහන්සේ ස්ත්‍රීය ගෙන් උපත ලත් ව්‍යවස්ථාව යටතේ උපන් සිය පුත්‍රයාණන් එවා වදාළ සේක. එසේ කළේ අප පුත්‍රකම ලබනු වස් උන් වහන්සේ විසින් ව්‍යවස්ථාව යටතෙහි සිටි අය මුදාගන්නා පිණිස ය. තවද ඔබ පුත්‍රයන් බව ඔප්පු කරන පිණිස, "අබ්බා, පියාණෙනී, " කියා හඬ ගසන තම පුත්‍රයාණන්ගේ ආත්මය දෙවියන් වහන්සේ අප සිත් වලට එවා වදාළ සේක. මෙසේ ඔබ තවදුරටත් දාසයෙක් නොව පුත්‍රයෙකි. පුත්‍රයෙක් නම් දේව වරමින් උරුමක්කාරයෙකි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

හෙබ්‍රෙව් 1:1-2

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ ආදී යුගවල දී නොයෙක් විට ද විවිධාකාරයෙන් ද දිවැසිවරුන් මඟින් අපේ පියවරුන්ට කතා කළ සේක. එහෙත් දැන් මේ අවසාන කාලයේ දී උන්වහන්සේ සිය පුත්‍රයාණන් මඟින් අපට කතා කළ සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 2:15-21

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය මෙසේය.

**අට දවස පිරුණු කල බිළිඳා හට ජේසුස් යන නාමය තබන ලද්දේ ය.**

තවද, දේව දූතයන් ඔවුන් කෙරෙන් සගලොවට ගිය කළ එඬේරු "අපි වහාම බෙත්ලෙහෙමට ගොස් ස්වාමින් වහන්සේ අපට දන්වා වදාළ මේ සිද්ධිය බලමු" යි ඔවුනොවුන් අතර කතා කර ගත්හ. ඔව්හු යුහුව ගොස් මරිය තුමීද ජෝසෙප්ද ගව ඔරුවක සතප්වා උන් බිළිඳා ද දුටුවෝය. ඔවූහු ඒ දැක මේ දරුවා ගැන තමන්ට දන්වන ලද දේ පළ කළහ. ඒ ඇසූ සියල්ලෝ, එඬේරුන් පැවසූ සියල්ල ගැන මවිත වූහ. එහෙත් මරියතුමී එකී සියල්ල සිත්හි නිදන් කොට ඒවා මෙනෙහි කළාය. එඬේරුද තමන්ට දන්වන ලද ලෙසම ඇසූ දුටු සියල්ල ගැන දෙවියන් වහන්සේට ගෞරව කරමින්ද ප්‍රශංසා කරමින්ද පෙරළා ගියහ. උන් වහන්සේගේ චර්මඡේදන පිළිවෙත සඳහා අට දවස පිරුණු කල, උන් වහන්සේ කුසෙහි පිළිසිඳ ගැනීමට පෙර දේව දූතයා විසින් දෙන ලද ජේසුස් යන නාමය උන්වහන්සේට තබන ලද්දේය.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.